ස්වයං අධ්‍යයනයට අත්වැලක්

ශ්‍රේණිය- 07

වාරය :- තෙවන වාරය

නිපුණතා මට්ටම :- 5 3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි

ක්‍රියාකාරකම :- 5 3 නර්තන ශිල්පීන් අගයමු



සැකසුම :- කේ. ජී.එස්. මානෙල් මිය
මප/වත්/ වත්තේගම බාලිකා විද්‍යාලය
වත්තේගම

මෙහෙයවීම :- නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කාර්යාලය
වත්තේගම

## උපදෙස්

මෙය ලිඛිත පාඩමකි. මෙය වැඩි දුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසැලේ ගුරු ඇසුර ලබාගත යුතුයි.

## හැදින්වීම-

උඩරට පහතරට සබරගමු යන දේශිය නර්තන සම්ප්‍රදායන් ආරක්ෂා කර ගනිමින් සංවර්ධනය කරමින් ඉදිරි පරම්පරාවට දායාද කිරීමෙහි ලා මහඟු මෙහෙවරක් කල ප්‍රවීන නර්තන ශිල්පීන් තිදෙනෙක් පිළිබදව අපි හය වන ශ්‍රේණියේදී ඉගෙන ගත්තේමු.

තවත් එවැනිම ප්‍රවීන නර්තන ශිල්පීන් තිදෙනෙකුගේ ජීවන තොරතුරු හා නර්තන කලාවට කල මෙහෙය පිළිබද මෙයින් අප අධ්‍යනය කරමු.

හය ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද නර්තන ශිල්පීන් ලෙස පහත සදහන් ශිල්පීන් තිදෙනා දැක්විය හැකිය



එස් . එච් සච්සිරිස් සිල්වා මහතා



එන් . ඒ සිරිබෝහාමි මහතා



නිත්තේවෙල ගුණයා මහතා

07 ශ්‍රේණියේදී අධ්‍යනය කිරීමට සුදානම් වන්නේ තවත් එවැනිම ශිල්පීන් තිදෙනෙකු පිළිබදවයි

1 ජේ. ඒ. සේදරමන් මහතා
2 රද්දැල්ලේ පොඩි මහත්තයා  මහතා
3 එම්. එච්.ගෝමිස් මහතා

# ජේ. ඒ. සේදරමන් මහතා



ජේ සේදරමන් මහතා

## මෙතුමාගේ ජීවන තොරතුරු

- ✓ මෙතුමා උඩරට නර්තන ශිල්පියෙකි
- ✓ මෙතුමා උපත ලැබුවේ 1908 -09-23 වන දිනයි
- ✓ අධ්‍යාපනය ලබා ඇත්තේ මහනුවර පුජාපිටිය විද්‍යාලයෙන් ය
- ✓ මෙතුමාගේ පියා වූයේ මාදන සිරිසේන ගුරුතුමායි
- ✓ උඩරට නර්තනය බෙරවාදනය චිත්‍ර ශිල්පය මූර්ති ශිල්පය නැකැත් ශාස්ත්‍ර පිළිබදව ඉගෙන ගන්නා ලද්දේ තම පියාණන් වන මාදන සිරිසේන ගුරුතුමාගෙනි
- ✓ සිංහල පාලි සංස්කෘත භාෂාව හා කාව්‍ය කරණය ඉගෙන ගන්නා ලද්දේ පන්සල ඇසුරෙනි
- ✓ ජේ ඒ සේදරමන් මහතා ඉතා දක්ෂ කලාකරුවෙකි

විදේශීය සංචාර සඳහා ඉදිරිපත් කරන ලද නර්තන

- 1930 වර්ශයේදී මෙතුමා ප්‍රංශය බලා පිටත්ව ගොස් සර්කස් කණ්ඩායමකට බැදී නර්තනයක් ඉදිරිපත් කළේය.

- ජර්මනිය,බෙල්පියම,ස්වීට්සර්ලන්තය,හංගේරියාව,ඉතාලිය සහ එංගලන්තය,වැනි රටවලද,සංචාරයයේ යෙදෙමින් නැටුම් ඉදිරිපත් කළේය.

- එංගලන්ත සංචාරයේදී මෙතුමා රාගිනි දේවිය සමඟ රාධා,ක්‍රිෂ්ණා නර්තනය සහ නාග නර්තනය ඉදිරිපත් කළේය.

- ඔහු විසින් ලියන ලද සුන්දර යුරෝපය නම් කෘතිය රාවණ නෘත්‍යක්ද ඉදිරිපත් කර ඇති බව සදහන්වේ.

- මෙතුමා විසින් සංචාරක නැටුම් කණ්ඩායමක්ද සකස් කරන ලදී.

- ප්‍රේක්ෂකයන් ඉදිරියේ රැගුම් දැක්වීම මෙතුමා විසින් කරන ලදී.

## <u>අධ්‍යාපන ක්ෂේත්‍ර උදෙසා ඉටුකර ඇති සේවය</u>

- ජේ.ඒ.සේදරමන් මහතා 1941 ජුනි 1 දින නර්තන ගුරුවරයෙකු ලෙස මුල්පත්වීම ලබා සේවය කරන ලද්දෙ මාවතගම මහා විද්‍යාලේය.
- ගිරාගම,පේරාදේණිය,පෝල්ගොල්ල,මීරිගම,නිට්ටඹුව යන ගුරු අභ්‍යාස විද්‍යාලවල නැටුම් සහ සංගීත පරීක්ෂකවරයේකු ලෙස මෙතුමා සේවය කළේය.
- ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ නැටුම් සහ සංගීත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලදී.

### මෙතුමා විසින් රචිත ග්‍රන්ථ

- සිංහල නාට්‍ය කලාව-1944
- නෘත්‍ය චින්තාමනි-1949
- උඩරට නැටුම් කලාව-1962
- නෘත්‍ය රත්නාකරය-1959
- ලංකාවේ යක්ෂ යුගය හෙවත් කොහොඹා යක් කංකාරිය - 1955
- ශුභ ශාන්ති විදි නොහොත් ලංකාවේ බලි උපත-1964
- බලි යාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත - 1967

## නිර්මාණය කරන ලද මුද්‍රානාට්‍ය කෘතී

- පණ්ඩුකාභය
- තේලපත්ත
- විජය කුවේණී

## කලාත්මක කටයුතු සදහා පිහිටුවන ලද සංවිධාන

- ✓ ලංකා මහජන කලා මණ්ඩලය
- ✓ රාවණා කලා සංගමය

<u>එම්.එච්.ගෝමිස් මහතා</u> .



- පහතරට නර්තන සම්ප්‍රදායේ මාතර ශෛලීය නර්තන ශිල්පියෙක ලෙස මෙතුමා හැදින්විය හැකිය.
- මෙතුමා ප්‍රවීණ ශාන්ති කර්ම ඇදුරු තුමෙක්.
- පහතරට ශාන්ති කර්ම වන *රට යකුම හෙවත් රිද්දියාගය, සුනියම් කැපිල්ල,මහ සොහොන්* සමයම වැනි ශාන්තිකර්ම පිළිබදව පුළුල් දැනුමක් ඇති පුද්ගලයෙකි.
- පහතරට සුවිශේෂී නර්තන අංග වන *නාග කන්‍යා,ගිනි සිසිල,පන්දම් පාලිය* වැනි නර්තන අංග නිසා මෙතුමා නර්තන ශිල්පියෙක් ලෙස ප්‍රසිද්ධියට පත් විය.
- ගැමි නාටක වලින් එකක් වන කෝලම් නාටකයේ,එන නාග කන්‍යා නැටුම ඉතා සිත් ගන්නා ලෙස සකස් කරන ලද්දේ ගෝමිස් ගුරුතුමා විසිනි.
- ගිනි සිසිල නම් නර්තන අංගය වේදිකාවට උචිත ලෙස සකස් කිරීමේ ගෞරවය මෙතුමාට ලැබී ඇත.
- පහතරට නර්තන වේදිකාවට උචිත ලෙස සකස් කරන ලද්දේ මෙතුමා විසිනි.
- රටවල් ගණනාවක තමන්ගේ නර්තන හැකියාවන් ප්‍රදර්ශනය කළ මෙතුමාට අන්තර් ජාතික වශයෙන් ගෞරව සම්මාන හිමි විය.
- එම්.එච්.ගෝමිස් මහතා සෞන්දර්ය අධ්‍යන ආයතනයේ බාහිර කථිකාචාර්ය වරයෙකු ලෙස සේවය කරන ලදී.


ගිනි සිසිල



පන්දම් පාලිය



රද්දැල්ලේ පොඩි මහත්මයා මහතා



එතුමාගේ ජීවන තොරතුරු :-

- ✓ දළදාවට කල විශේෂ සේවය වෙනුවෙන් ඔහුට පරංගියාවත්ත නම් පෙළපත් නාමය හිමි විය.
- ✓ පාසල් අධ්‍යාපනයට පලමුවෙන්ම සබරගමු නර්තන සම්ප්‍රදාය ඇතුලත් කලේ මෙතුමාය.

- ➢ මෙතුමා සබරගමු නර්තන සම්ප්‍රදායේ නර්තන ශිල්පියේක් ලෙස හැදින්විය හැකිය.
- ➢ මෙතුමා පරංගියා වත්තේ පොඩි මහත්තයා යන නමින්ද හැදින්වේ

- රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා ශිල්පීය ඥානය ලබාගන්නා ලද්දේ තම පියාණන් වූ රද්දැල්ල ගම්මැදි රාලලාගේ චන්දන හාමි මහතාගෙනි.
- සබරගමු නර්තනය මුල් යුගයේ සීමා වී තිබුණේ ශාන්තිකර්මවල රඟ දැක්වීමටත්,විහාරස්ථානවල පැවති පින්කම් ආදියටත් පමණි. ඉන් පසු මෙතුමා විසින් 1947 වර්ෂයේදී සබරගමු නර්තනය ඉගැන්වීම සඳහා කලායතනයක් පිහිටුවන ලදී.
- 1959 වර්ෂයේදී මෙතුමාට ගුරු පත්වීමක් ලැබී,දික්වැල්ල මහා විද්‍යාලයේ සේවය කරන ලදී.
- 1964 දී මෙතුමාට කථිකාචාර්ය පදවියක් ලැබ ගිරාගම ගුරු විද්‍යාලයේ,ඉගෙනුම ලබන ගුරුවරුන් සඳහා නියමිත කාලසීමාවට වඩා වැඩිපුර කාලසීමාවක් යොදා උපරිම කැපවීමෙන් ඉගැනවීමේ කටයුතුවල නිරත විය.
- 1977-1990 දක්වා සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කළේය.
- ප්‍රාසාංගිකව ඉගැන්වීමේ කටයුතුවල නිරත වූ බැවින් වැඩි සිසුන් පිරිසක් නර්තන අධ්‍යාපනයට ප්‍රවිෂ්ට කරවීමට හැකි විය.
- සබරගමු නර්තන විෂයමාලා සකස් කිරීමට මූලිකත්වය ලබාදුන් මෙතුමා ඒ පිළිබඳව වාද විවාද ඉදිරිපත් කළේය.
- සබරගමු නර්තනයට,ගායනයට මෙන්ම,දවුල් වාදනයට ඉතා දක්ෂතාවක් දැක්වූ කලා ශිල්පියෙකි.

- පාසලට ගුරු විද්‍යාලයට විශ්ව විද්‍යාලයට පමණක් එතුමාගේ සේවය සීමා කළේ නැත .ලැබෙන සෑම අවස්ථාවකම පහන් මඩු,ගම්මඩු,ආදි ශාන්ති කර්මවලත් නර්තනයෙන් දායකත්වය ලබාදෙන ලදී.